# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2199/18 – 2020 ඔක්තෝබර් මස 29 වැනි බ්‍රහස්පතින්දා – 2020.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2020 අංක 130 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2018/HW/451.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : DSB/LND/03/F1/35-XXII.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත.

2. **ඉඩමේ විස්තරය. –** දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, ගැටමාන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක H/BLA/2019/410 හා 2019.07.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' – මහහේන – ප්‍රමාණය: හෙක්. 0.0083

උතුරට: අ.ග.පි. 296 (ගැටමාන) හි කැබලි අංක 1962, 1964 සහ 1963; නැගෙනහිරට: සුගත් ප්‍රියන්ත ජයසේකර හිමිකම් කියන මගහේන; දකුණට: සුගත් ප්‍රියන්ත ජයසේකර හිමිකම් කියන මගහේන සහ අ.ග.පි. 296 (ගැටමාන) හි කැබලි අංක 1960; බටහිරට: අ.ග.පි. 296 (ගැටමාන) හි කැබලි අංක 1962 සහ 1964.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

මගේ අංකය: 4-3/6/2012/HW/281.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/3/2/22.

2013 ජූලි මස 17 වැනි දින අංක 1819/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 230 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුලත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6,
රජමල්වත්ත පටුමඟ,
බත්තරමුල්ල.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 486ඒ, හෝමාගම නගරය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෝමාගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ක.සි. 520001, කලාප 19, පත්‍ර අංක 43 හා 2019.02.23 දිනැති කැඩැස්තර සිතියමේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:

**01. කැබලි අංක 924 – කැන්දලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0004 ක් පමණ**

උතුරට: කැබලි අංක 557 හා 923; නැගෙනහිරට: කැබලි අංක 923 සහ 555; දකුණට: කැබලි අංක 925; බටහිරට: කැබලි අංක 557.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.